# හොල්මන් ගෙදර



තිසුමි නිමෙත්මා වීරසේකර

# හොල්මන් ගෙදර


## තිසුම් නිමේත්මා වීරසේකර
කතෘ


**කතෘගේ වෙනත් කෘති**

*දැගකාර තාර පැටියා*

*සිඟිතිගේ ගෙවත්ත*

*කොණ්ඩ කැවුම*


**මහනුවර මහමායා බාලිකා විදුහල**

**7 ශ්‍රේණිය E (2025)**

**2025.02.08**

**ISBN-978-624-208-842-6**

# පිදුම

මාගේ ආදරණීය

දෙමවුපියන්ට

සෙනෙහසිනි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන හෙරණගත්කරණී V ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය. මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

සිනුලියි, මනුකයි අයියයි, නංගියි, දවසක් මේ දෙන්නා ඉස්කොලෙ ගිහින් ගෙදර ඇවිල්ලා සෙල්ලම් කරන්න යන්න ලෑස්ති වුණා.

''කොහෙද ළමයි මේ යන්න ලෑස්ති වෙන්නේ '' අම්මා ඇසුවා.

'' අපි සෙල්ලම් කරන්න යනවා අම්මා ''සිනුලි පැවසුවා.
'' හා, හා හැබැයි හවස් වෙන්න කලින් ගෙදර එන්න ඕන '' අම්මා කිවුවා.

'' හොඳයි අම්මා, අපි ඉක්මනට එන්නම්'' කියමින් සිනුලියි මනුකයි ගෙදරින් එළියට පැන ගත්තා



යාළුවෝ ටික ඔක්කෝම කමල්ගේ ගෙදරට එකතු වුණා.
" අපි අද කොහෙද සෙල්ලම් කරන්නේ ?, අපේ ගෙදරට අද තාත්තාගේ යාලුවෝ ටිකක් එනවා ඒ හින්දා අද අපිට මෙහේ සෙල්ලම් කරන්න බැරිවෙයි " කමල් කිවුවා.

" එහෙනම් අද අපි මොකද කරන්නේ, අපිට සෙල්ලම් කරන්න තැනක් කොහොමද අපි හොයා ගන්නේ " සිනුලි ඇසුවා.

හැමෝම කල්පනා කරන්න පටන්ගත්තා. ඒ වෙලාවේ " යාළුවනේ මට හොඳ තැනක් මතක් වුණා " මනුක කිව්වා.
" අනේ ඒ තැන කොහෙද ? ඉක්මනට කියන්නකෝ " සිනුලි කිව්වා

" මේක ටිකක් බය හිතෙන තැනක්. අර හොල්මන් ගෙදර පහළින් තියෙන තැනිතලාව, අපි අද ඒකේ සෙල්ලම් කරමු හැබැයි කවුරුත් වැඩිය සද්ද නැතිව සෙල්ලම් කරමු. ඊට පස්සේ හවස් වෙන්න කලින් ගෙවල්වලට යමු " කියලා මනුක කිවුවා.



හැමෝම ඒකට එකඟ වුනත් හිත්වල පොඩි බයක් තිබුණා. මොකද ඒ හොල්මන් ගෙදර ගැන වැඩිහිටියෝ විවිධ බය හිතෙන කතා කියලා තිබුණා.

කොහොම වුනත් යාළුවෝ ටික එතනට ගියා ම ඒ ඔක්කෝම අමතක වුණා. හැමෝම වගේ කෑකෝ ගසමින්, නටමින්, සෙල්ලම් කරමින් විනෝද වුණා.

ටික වෙලාවකට පස්සේ මෙයාලා බෝල ගහන්න සිතුවා. මුලින් ම යාළුවො කණ්ඩායම් වලට බෙදුනා. හැමෝම වගේ සෙල්ලම් කරා.



අන්තිමේට ගහන්න හිටියේ සිනුලි. සිනුලි බෝලේ වේගෙන් එනකොට බය වෙනවා. ඒ හින්දා වෙන දවස්වලට සිනුලිට බෝල දාන්නේ අයියා.

ඒත් අද දැම්මේ කමල්. කමල් දාපු බෝලය වේගයෙන් ආවා. සිනුලි බයට ඇස් දෙක පියාගෙන ම වේගයෙන් පහරක් එල්ල කරා, ඒ වෙලාවේ බෝලය හරියටම පිත්තේ වැදුණු නිසා බෝලය ඉහළින් වේගයෙන් ඇදී ගියා. ඊට පස්සේ වුණ දෙයින් හැමෝම බව වුණා. ඉහළ අහසේ ඇදී ගිය බෝලය අර හොල්මන් ගෙදර ජනේලයක වීදුරුවක් කඩාගෙන ඒක ඇතුළට ගියා. හැමෝම බය වෙලා එකිනෙකාගේ මූණ බලාගත්තා.

"අපි දැන් මොකද කරන්නේ, අපිට එක බෝලයයි තියෙන්නේ" මනුක කිවුවා.
" හරි අපි මෙහෙම කරමු. අපි හැමෝම ඒ ගෙදරට යමු. මොකක් හරි බය හිතෙන දෙයක් වුණොත් හැමෝම දුවමු. බෝලේ ගන්න බැරි වුණත් කමක් නෑ දුවලා එමු." කමල් කිව්වා.

හැමෝම ඒකට කැමති වුණා. මොකද එයාලාටත් පොඩි ආසාවක් තිබුණා මේ වගේ භයානක වීරක්‍රියා කරන්න.

හැමෝම එක්කෙනා පිටිපස්සේ එක්කෙනා පේළියට හොල්මන් ගෙදරට යන්න තියෙන පාර දිගේ උඩට යන්න පටන්ගත්තා. ඒ අතරේ,

" මගේ පන්තියේ යාළුවෙක් හිටියා මියුරි කියලා. දැන් දවස් දෙක තුනකට කලින් එයා හිටියේ මෙහේ. එයාලාගේ ගෙවල් තිබ්බෙත් අපි අර සෙල්ලම් කර කර හිටපු තැනිතලා පිට්ටනිය ළඟමයි. දැන් නම් ඒක වහලා දාලා.

එයාලාගේ ගෙදර පිටිපස්සට ගිහිල්ලා ගහක් උඩට නැග්ගොත් අර හොල්මන් ගෙදර හොඳට පේනවා ” සිනුලි කියන්න පටන්ගත්තා.

හැමෝම එයලාගේ ගමන නවත්තලා සිනුලිට ඇහුම්කන් දුන්නා. සිනුලිත් ඉතින් එයාගේ කතාව කියාගෙන ගියා.

“ ඔයාලා දන්නවාද සමහරක් දවස්වලට මේ ගෙදරින් එක එක බඩු බිඳෙන සද්ද ඇහිලා තියෙනවාලු. ඉතින් මෙයාලා හිතලා තියෙන්නේ ඒ හුළඟට කියලා. ඔයාලා දන්නවාද ඇයි එයාලා ගෙදරින් ගිහිල්ලා තියෙන්නේ කියලා ?. ඒක නම් ටිකක් බය හිතෙන කතාවක් ” සිනුලි කියාගෙන ගියා.



“ සාමාන්‍යයෙන් මියුරිගේ තාත්තා වැඩ ඇරිලා ගෙදර එනකොට රෑ වෙනවාලු. ඒ එන්නෙත් අර හොල්මන් ගෙදර ළඟින් වැටුණු පාරකලු. එහෙම ආවත් කවදාකවත් කිසි බයක් නැතිවලු ආවේ. ඒත් එක දවසක් මෙයාගේ තාත්තා රෑ වෙලා ගෙදර එනකොට මෙයා දැක්කාලු දැන් අපි මේ ඉන්න පාර දිගේ මොකෙක් හරි සතෙක් පහළට එනවා වගේ.

ඒ වෙලාවේ මියුරිගේ තාත්තා පොඩ්ඩක් බය වෙලා තියෙනවා. ඊට පස්සේ එයා ගහක් පිටිපස්සට ගිහින් චුට්ටක් වෙලා බලාගෙන ඉඳලා තියෙනවා. ඒ වෙලාවේ අර සතාගේ ඇස් කරුවලේ දිලිසෙනකොට තවත් බය හිතුණාලු. එතකොට අර සතා තවත් ඉස්සරහට ආවාලු.

ඉතින් මෙයාගේ තාත්තා හොඳටම බය වෙලා පස්සවත් නොබලා ගෙදර යනකන්ම දුවලා. මියුරියි අම්මයි මොකද මේ කියලා බලන්න එලියට එනකොට තාත්තා කකුල් දෙකත් වෙවුල වෙවුල හති අරිමින් හිටියාලු. ඊට පස්සේ ඇඟ හෝදගෙන හිස්බඩම නිදාගෙන බයටම. පහුවදා උදේලු මේ හැමදෙයක්ම කියලා තියෙන්නේ. ඊට පස්සේ තමයි එයාලා මෙහෙන් ගිහින් තියෙන්නේ ''

සිනුලි කතාව ඉවර කළා. හැම කෙනෙක්ම කට ඇරගෙන සිනුලි දිහා බලාගෙන හිටියා. දැන් හැම ළමයෙක්ම බය වෙලා ඉන්නේ.

'' ඒක නෙවෙයි ඔයා කොහොමද ඔය සිද්ධිය දන්නේ ?'' සෙනුමි ඇහුවා.

'' එයාලා මෙහෙන් යන නිසා එයා ඉස්කෝලෙනුත් අස්වෙලා තමයි ගියේ. ඒ දවසේ තමයි එයා මට මේ හැමදෙයක්ම කිවුවේ. '' සිනුලි කිව්වා.

දැන් හැමෝම මේ සිනුලිගේ කතාවට බයවෙලා ඉන්නේ. දැන් කාටවත් මේ හොල්මන් ගෙදර ඇතුලට යන්න කිසිම ආසාවක් නෑ.

" මං හිතන්නේ මගේ කතාවට හැමෝම බය වෙලා ඉන්නේ නේද ? කමක් නෑ අපි ඉක්මනට ගිහිල්ලා බෝලේ අරගෙන ආවොත් අපි කාටවත් ම බය වෙන්න ඕන නෑ. ඒ හින්දා අපි ඉක්මනට යමු. මට ආසයි ඒක ඇතුළ කොහොමද කියලා බලන්න. " සිනුලි කිවුවා.

ඒපාර හැමෝටම ලොකු කුතුහලයක් ආවා, මේ හොල්මන් ගෙදර ඇතුල කොහොමද කියලා බලාගන්න. ඊට පස්සේ හැමෝම ආයෙත් එක්කෙනා පිටිපස්සේ එක්කෙනා පේලියට අර හොල්මන් ගෙදරට යන්න තියෙන පාර දිගේ ගියා.



දැන් හැමෝම හොල්මන් ගෙදරට ළං වෙලා ඉන්නේ. බැලු බැල්මට ඒක හරිම පරණ ගෙදරක්. එකේ දොර කැඩිලා තිබුණා. ඒගොල්ලෝ බයෙන් බයෙන් ඇතුලට ගියා. ගේ ඇතුළට ගිය ගමන් ම එයාලා පිවිසුනේ පරණ සාලයකට. සාලය මැද එයාලාගේ බෝලේ තිබුණා කමල් ගිහිල්ලා ඒක අහුලගත්තා.

ඊට පස්සේ එක පාරටම එයාලාගේ පිටිපස්සෙන් මොකක් හරි බිමට වැටිලා බිඳිලා ගියා. හැමෝම ඒ සද්දෙට හොඳටම බය වුණා. ඊට පස්සේ හැමෝම කෑගහගෙන ඉස්සරහ තිබුණ පඩිපෙළ නැගගෙන කාමරයකට ගොඩ වුණා. ඊට පස්සේ කමල් ඉස්සරහට පැනලා ඒ කාමරේ දොර වැහුවා. හැමෝගෙම පපුව දිඩි දිඩි ගාමින් තිබුණා.

" මම කිව්වේ, අර බඩු බිඳෙන සද්දේ මියුරිලට ඇහුණා කියලා. එදා අර මියුරිලගේ තාත්තා දැක්කා කියපු සතා ද දන්නේ නෑ " සිනුලි වෙවුලමින් කිව්වා.

" මගේ සීයා කියලා තියෙනවා මේ ගෙදරට ආපු කවුරුහරි ඉර බහින්න කලින් මෙහෙන් ගියේ නැතිනම් මේකේ ඉන්න හොල්මන අපිව කනවාලු " මෙනුක කිවුවා.

" එහෙනම් අපිට කරන්න තියෙන්නෙ එක දෙයයි. කවුරු හිටියත් කමක් නෑ අපි මෙහෙන් පැනලා දුවමු. " මනුක කිවුවා.


හැමෝම ඒකට කැමති වුනා. ඊට පස්සේ දොර ගාව හිටපු කමල් " එකායි.... දෙකායි.... තුනායි..... " කියලා දොර ඇරියා.



දොර අරිනකොටම එළියේ හිටියේ පූසෙක්. මේ පූසා එකපාරටම මේ කාමරේ ඇතුළට පැනලා ඒ මේ අත දුවන්න පටන්ගත්තා. ඒ දුවනකොට මේසේ උඩ තිබුණු සමහරක් බඩු බිමට වැටිලා බිඳුනා. ඊට පස්සේ හැම ළමයෙක්ටම තේරුම් ගියා මේකේ හිටපු මේ හොල්මන මේ පූසා කියලා. ඊට පස්සේ හැම ළමයෙක්ටම හිනා ගියා. අන්තිමට මේ යාළුවෝ ටික ඉක්මනට එතැනින් පිටත් වෙලා ගියා.

හවස් වෙන්න කලින් ඉක්මනට ගෙදර ආපු නිසා අම්මත් සතුටු වුණා. ඊට පස්සේ ආයෙ කවදාවත් අර ගෙදර හොල්මන් ගෙදර කියලා හැඳින්වුවේ නැ. ඒකට කිවේ ගමේ ළමයින්ගේ "සෙල්ලම් ගෙදර" කියලා.

# නිමි.



# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්

ISBN-978-624-208-842-6